# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009

### (2010 මැයි / ජූනි)

### සමාජීය විද්‍යා පීඨය

### භූගෝල විද්‍යාව- GEOG –E2025

### සිතියම් විද්‍යාව

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි කාලය :පැය 03 යි

---

(ඇඳීමේ කඩදාසි සපයනු ලැබේ. ගණක යන්ත්‍ර භාවිතයට අවසර ඇත.)

01. එක් එක් යුගයන් කෙරේ විශේෂ අවධානය යොමු කරමින් ලෝකයේ සිතියම්කරණයේ විකාශනය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 25)

02. (i) 'සිතියමක්' නිර්වචනය කරන්නේ කෙසේ ද? (ලකුණු 05)

(ii) සිතියමක අනිවාර්යයෙන් ම අඩංගු වියයුතු මූලිකාංග කවරේද? (ලකුණු 10)

(iii) චුම්භක උතුර සහ සැබෑ උතුර අතර වෙනස දක්වන්න. (ලකුණු 05)

(iv) සිතියම සහ පිඹුර අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05)

03. (අ)

(i) 1 : 50,000 සහ 1 : 10,000 පරිමාණවලට ශ්‍රී ලංකාව ආවරණය වන පරිදි නිර්මාණය කොට ඇති සිතියම් ගණන කොපමණද? (ලකුණු 02)

(ii) පරිමාණය 1 : 50,000 සිතියමක $cm^2$ 100 නියෝජනය වන $Km^2$ ගණන කොපමණද? (ලකුණු 02)

(iii) කොළඹ සිට මාතරට ඇති දුර සැතපුම් 99 කි. ආසන්න වශයෙන් එම ප්‍රමාණය Km වලින් ප්‍රකාශ කරන්න. (ලකුණු 02)

(iv) 1 : 50,000 පරිමාණයෙන් ඇඳ ඇති සිතියමක $Km^2$ හතරක (04) වපසරියකින් යුත් කුඹුරු යායක් 1 : 20,000 පරිමාණයට නැවත නිර්මාණය කළහොත් එම කුඹුරු යාය $cm^2$ කොමණ ප්‍රමාණයකින් දක්වේද? (ලකුණු 02)

(v) 1 : 31,680 පරිමාණයට නිර්මාණය කොට ඇති සිතියමක වර්ග අඟලක භූමි ප්‍රදේශය පුරා පවතින පාෂාණ උද්ගතයක් 1 : 15,840 පරිමාණයට නැවත නිර්මාණය කළහොත් එම උද්ගතය දක්වෙන වර්ග අඟල් ප්‍රමාණය කොපමණ ද?. (ලකුණු 02)

(ආ) මතු සඳහන් වගුවේ දත්තවලට අනුව වර්ග සැතපුම් ප්‍රමාණය ගණනය කරන්න.

| | පරිමාණය | චතුරස්‍රයේ ප්‍රමාණය (අඟල්) | වර්ග සැතපුම් ගණන |
|---|---|---|---|
| i) | 1 : 63,360 | 1 x 1 | .................................. |
| ii) | 1 : 31,680 | 4 x 4 | .................................. |
| iii) | 1 : 126,720 | 1 x 1 | .................................. |
| iv) | 1 : 47,520 | 1.5 x 1.5 | .................................. |
| v) | 1 : 6336 | 10 x 10 | .................................. |

(ලකුණු 2 x 5=10)

ඇ) 1 : 63,360 පරිමාණයට විකර්ණ රේඛීය පරිමාණයක් නිර්මාණය කරන්න. (ලකුණු 05)

04. (i) A.H. රොබින්සන් විසින් ඉදිරිපත් කල බෑවුම් විශ්ලේෂණ ක්‍රමය දළ සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(ii) එලෙස නිර්මාණය කරන ලද බෑවුම් විශ්ලේෂණ ක්‍රමයක ව්‍යවහාරික වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 10)

05. (i) ප්‍රිස්ම මාලිමාව ඇසුරෙන් කුඩා ප්‍රදේශයක් මැනීම සිදුකරන ආකාරය පිළිවෙලින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(ii) එම ක්‍රමයේ දුර්වලතා කවරේද? (ලකුණු 05)

(iii) එම දුර්වලතා මගහරවා ගැනීම සඳහා භාවිතා කළ හැකි උපාය මාර්ග කවරේද? (ලකුණු 05)

06. මතු සඳහන් ඒවායින් <u>දෙකකට</u> උචිත කටුසටහන් යොදා ගනිමින් සංක්ෂිප්ත සටහන් සපයන්න.

(i) උස්බිම් වක්‍රය

(ii) උච්චමාන බහුලතා

(iii) තලාතල වක්‍රය

(iv) බහු හරස්කඩ ක්‍රමය (ලකුණු 12.5 x 2=25)

07. කිසියම් නිරීක්ෂණ මධ්‍යස්ථානයක වසර 30 ක කාලය තුල දී වාර්තාවූ වර්ෂාපතන දත්ත ඔබට ලැබී තිබේ යැයි සිතන්න. ඒවා පදනම් කොටගෙන

(i) අපගමන ප්‍රස්තාරය,

(ii) ත්‍රෛවාර්ෂික චල මාධ්‍යක ප්‍රස්තාරය,

(iii) පස්වාර්ෂික චල මාධ්‍යක ප්‍රස්තාරය,

නිර්මාණය කරන ආකාරය කෙටියෙන් දක්වා, එම ප්‍රස්තාර සටහන විශ්ලේෂණය කරන අයුරු දක්වන්න.

(ලකුණු 5+5+5+10=25)

***************************